www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බොරුව එළිදරව් වෙයි

## A lie exposed

2010 ජූලි 20

මාධ්‍යයන්ගෙන් බොහෝ දෙනෙක් සහ සමස්ත ලිබරල් සංස්ථාපිතය විසින් 1960 ගනන්වලින් මෙපිට වඩාත් ම ප්‍රගතිශීලී සමාජ ප්‍රතිසංස්කරනය ලෙස උත්කර්ෂනයට නංවනු ලබන ඔබාමාගේ සෞඛ්‍යාරක්ෂන නීතිය සම්මත වීමෙන් මාස හතරකට පසුව එම නීතියේ ප්‍රතිගාමී ගම්‍යයන් වෙන කවරදාටත් වඩා ඉස්මතු වෙමින් පවතී.

ධවල මන්දිරය කියා සිටි පරිදි මෙම සෞඛ්‍ය සැලසුමේ කේන්ද්‍රීය කාරනාව වන්නේ රක්ෂනය නො වූ ඇමරිකානුවන් කෝටි ගනනකට රක්ෂන ආවරනය පුලුල් කිරීම සහ සාමාන්‍ය පුරවැසියන්ට දරාගත නො හැකි සෞඛ්‍ය වියදම් සීමාකිරීම යි. වියදම් කප්පාදුව සහ "කාර්යක්ෂමතාවන්" ක්‍රියාත්මක කිරීම සෞඛ්‍යාරක්ෂනයේ ගුනාත්මක බවට බලපාන්නේ නැති බව ජනාධිපතිවරයා කීවේ ය. ඊට අමතරව දැනටමත් රක්ෂනය වී ඇති අයට ඔවුන්ගේ වෛද්‍යවරුන් සහ සෞඛ්‍ය සැලසුම් තවදුර තබාගත හැකි වේ.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය (ලෝසවෙඅ)* විස්තර කොට ඇති පරිදි මෙම කියාපෑම් අසත්‍ය ය. සෞඛ්‍ය නීතියේ අරමුන වන්නේ මිලියන ගනන් ඇමරිකානුවන්ට දෙන ආවරනය අඩුකිරීම සහ සීමාකිරීම මගින් එක්සත් ජනපද සංගතවල සහ ආන්ඩුවේ සෞඛ්‍ය වියදම් කපාහැරීම යි.

පාලක පන්තිය ඔබාමාගේ "ප්‍රතිසංස්කරනය" දැකගත්තේ සංගතවලට හාම්පුතුන් විසින් වියදම් දරන රක්ෂන සැලසුම් කුනුකූඩයට දැමීමට සංගතවලට අවස්ථාවක් ලැබීම ලෙස හෝ අවම වසයෙන් ප්‍රතිකාර, වෛද්‍යවරුන් සහ රෝහල් තෝරාගැනීමට කම්කරුවන්ට ඇති හැකියාව සීමාකිරීමක් ලෙස ය.

ලෝසවෙඅ අනතුරු ඇඟවූයේ මෙහි ප්‍රතිවිපාක වශයෙන් කම්කරුවන්ට අඩු ආවරනයක් දෙනු ලබන අතරේ පොහොසතුන් මුදල් දී මිලට ගතහැකි හොඳ ම වෛද්‍ය ප්‍රතිකාර භුක්ති විඳීමේ වරප්‍රසාද සහිත පන්තිය මත පදනම් වූ පද්ධතියක් ස්ථාපනය වනු ඇති බවයි.

මෑත ප්‍රවෘත්ති වාර්තා මෙම අනතුරු ඇඟවීම සනාථ කර තිබේ. "රක්ෂනකරුවෝ වෛද්‍යවරුන් තෝරාගැනීම සීමාකරන සැලසුම් ඉදිරියට දමති" යන හිසින් යුතුව ජූලි 18 දා *නිව් යෝක් ටයිම්ස්* පුවත්පතේ පලවූ වාර්තාවක් සඳහන් කරන පරිදි: "ඔබාමා පරිපාලනය නව ජාතික සෞඛ්‍යාරක්ෂන නීතිය ක්‍රියාවේ යෙදවීම ආරම්භ කරද්දී රටෙහි විශාලතම රක්ෂනකරුවෝ වෛද්‍යවරුන් හෝ රෝහල් පටු ලෙස තෝරාගැනීමක් භාවිතා කිරීම සහභාගිවන්නනන්ගෙන් ඉල්ලා සිටිනු ලබන කප්පාදු කල පාරිතෝෂික සහිත දරාගත හැකි සැලසුම් ඉදිරියට දමමින් සිටිති."

ඇට්නා, සිග්නා, ද යුනයිටඩ්හෙල්ත් ග්‍රෑප් සහ වෙල්පොයින්ට් යන රක්ෂන දැවැන්තයෝ නිව් යෝක්, සැන් ඩියේගෝ සහ චිකාගෝහි කුඩා හාම්පුතුන් සඳහා "සීමිත ජාල" සහිත සැලසුම් ඉදිරිපත් කර ඇති බව සඳහන් කල ලිපිය, රක්ෂනකරුවෝ සහ ඔවුන්ගේ උපදේශකයෝ "සියලු ප්‍රමානයේ ව්‍යාපාර වියදම් කපාහැරීම සඳහා මෙම සැලසුම් වෙත ආකර්ෂනය වනු ඇතැ" යි අපේක්ෂා කරන බව එය තවදුරටත් සඳහන් කලේ ය.

"සැබෑ තත්වය වන්නේ ඇමරිකානුවන් වැඩි පිරිසකගෙන් ඔවුන් නව ජාලයන්ගෙන් පිටස්තරව සිටීනම් ඔවුන්ට ඔවුන්ගේ ම වෛද්‍යවරු තෝරාගැනීමේ හෝ තබාගැනීමේ වරප්‍රසාදය සඳහා අධික මිල ගනන් ගෙවීමට ඔවුන්ට කියනු ඇත. පාරිභෝගිකයින්ට සෞඛ්‍යාරක්ෂන තෝරාගැනීම් බොහොමයක් දිගට ම තබාගත හැකි යයි ජනාධිපති ඔබාමා සහ අනෙකුත් නිලධාරීන් කල අනවරත සහතික වීම් මතක තිබෙන බොහෝ දෙනෙකුට මෙය පුදුමයක් ලෙස හැඟෙනු ඇත" *ටයිම්ස්* ලියයි.

උදාහරනයක් ලෙස නිව් යෝර්ක්හි ඇටීනා රක්ෂන සමාගමේ "පටු ජාල" සැලසුම ප්‍රවේශය සපයන්නේ එමගින් සාම්ප්‍රදායිකව ආවරනය කරන ලද වෛද්‍යවරුන්ගෙන් අඩකට සහ රෝහල්වලින් තුනෙන් දෙකකට පමනක් වෙද්දී යුනයිටඩ්හෙල්ත් මගින් ආවරනය කරනු ලබන සැන් ඩියේගෝහි පාසැල් සේවකයින් 80,000ක් දෙනාව ඔවුන් තෝරාගනු ලබන වෛද්‍යවරුන්ගේ ගුනාත්මක භාවය සහ අයකරන මුදල මත ඔවුන්ගේ වියදම් කිරීමේ හැකියාව මත රඳාපවතින බහුශ්‍රේනි සෞඛ්‍ය සැලසුමකට ගැටගසනු ලැබ ඇත.

එවැනි පියවර මගින් සියයට 15ක් ඉතිරි කරගැනීමට හාම්පුත්තු බලාපොරොත්තු වෙති.

"න්‍යාය පත්‍රයේ වඩාත් ම බලගතු අයිතමය වන්නේ දරාගත හැකි වීම යි" යනුවෙන් යුනයිටඩ්හෙල්ත්හි සෞඛ්‍ය සැලසුමේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී වෛද්‍ය සෑම් හෝ පුවත්පතට කීවේ ය. ඔබාමාගේ සෞඛ්‍යාරක්ෂන "ප්‍රතිසංස්කරනය" ආරම්භයේ පටන් ම ආවරනය වර්ධනය කිරීම නොව වියදම් කැපීම ඉලක්ක කරගත් එකක් බව *ටයිම්ස්* සහ අනෙකුත් ලිබරල් සංස්ථාපිතයේ කොටස් හොඳින්

දැනසිටි සහ අනවරතව මහජනයාගෙන් වසන් කල කරුනකි. ලිපිය පෙන්වා දෙන ආකාරයට පනත පිලියෙල කරමින් තිබෙද්දී පවා සිග්නා සමාගමේ රක්ෂන විධායකයෙක් එහි ප්‍රධාන විධායක නිලධාරීන්ට ලැබෙන සුපිරි-ලාභ සැලසුම් පිලිබඳව කියමින් සිටියහ.

"මෙමගින් කෙරෙන්නේ ගුසි වෛද්‍යවරුන්ව අත්හැර දැමීම" යයි කැලිෆෝනියාහි විස්තා නගරයේ හැරෝ බයිසිකල් සංස්ථාවේ පාලක පීටර් ස්කෝඩා පුවත්පතට කීවේ ය. "එහි අනුපාතය සියයට 35කින් වැඩිවීමකට මුහුන දුන් හැරෝ, තම සේවකයින් සැන් ඩියේගෝහි ස්ක්‍රිප්ස් සෞඛ්‍ය ක්‍රමය සමග අනුබද්ධිත සෞඛ්‍ය කන්ඩායම් දෙකක වෛද්‍යවරුන් විමසීමෙන් වලක්වන ඇට්නා සැලසුමකට මාරු විය. සේවකයෝ ඉවත් කරන ලද වෛද්‍යවරුන්ගෙන් කෙනෙක් වෙත ගියහොත් සමස්ත බිල්පත ගෙවීමේ වගකීම ඔවුන්ට පැවරේ" යයි ප්‍රශංසා මුඛයෙන් යුතුව *ටයිම්ස්* සඳහන් කරයි.

1990 ගනන්වල සෞඛ්‍ය කලමනාකරන සංවිධාන (එච්එම්ඕ) ස්ථාපනය කිරීම සමගින් සංගත සහ රක්ෂනකරුවෝ විශේෂඥ වෛද්‍යවරුන් හමුවීමට සහ රෝහල්වලට යාමට ඇති ඉඩකඩ සීමාකිරීමට උත්සාහ කල අවසන් අවස්ථාවේ එය යෝධ මහජන ප්‍රතිරෝධයක් අවුලුවාලූ බව *ටයිම්ස්* සඳහන් කරයි. *නිව් යෝක් ටයිම්ස්* සහ අනෙකුත් මාධ්‍යවල උපකාරය සමගින් සිය සෞඛ්‍යාරක්ෂන "ප්‍රතිසංස්කරනයේ" සැබෑ අන්තර්ගතය වහංගු කිරීමට ඔබාමා යත්න දැරුවේ ඒ නිසා ය.

සැලසුමේ කොන්දේසි මගින් රක්ෂනාවරනයේ පවත්නා මට්ටම් නඩත්තු කිරීම පසෙක තැබුවත් සංගතයන් රක්ෂනාවරන සැපයීමට කොහෙත් ම බැඳී සිටින්නේ නැත. ඒ වෙනුවට වඩා වියදම් අධික යයි ආන්ඩුව සිතන රක්ෂනාවරන පවත්වාගෙන යන සමාගම් දඬුවම් බද්ධකට මුහුනපානු ඇත. ඊට අමතරව හාම්පුතුන් වැටුප් පාරිතෝෂික නො කඩවා ගෙවීමට වැයකරන මුදලට වඩා ඉතා අඩු කුඩා දඩයක් ගෙවීමට පමනක් බැඳී සිටිති.

2006 දී ප්‍රාන්ත ආන්ඩුව සෞඛ්‍යාරක්ෂන ප්‍රතිසංස්කරනයක් බලාත්මක කල මැසචුසෙට්ස් ප්‍රාන්තයේ, හාම්පුත්තු සියගනනක් ආවරනය සැපයීම කුනුකූඩයට දමමින් ප්‍රාන්තයෙන් සපයන සෞඛ්‍යාරක්ෂන වැඩසටහනකට බැඳීම සඳහා කම්කරුවන්ට බලකිරීමේ විකල්පය තෝරාගනිමින් සිටිති. මෑතක දී *බොස්ටන් ග්ලෝබ්හි* පලවූ ලිපියකට අනුව ඉහල යන වියදම් සහ නො නවතින පසුබෑසීමක තතු යටතේ සමාගම් කියා සිටින්නේ දහස් ගනනින් පාරිතෝෂික ගෙවනවාට වඩා සේවකයෙකුට දල වසයෙන් වසරකට ඩොලර් 295ක් පමන වියදමක් යන සෞඛ්‍ය රක්ෂනය නො ගෙවීම නිසා ගෙවීමට සිදුවන ප්‍රාන්ත දඩය ගෙවීම වඩා ලාභදායක බවයි.

ඔබාමාගේ සැලසුම සම්පූර්නයෙන් ක්‍රියාත්මක වීම ඇරඹුන විට ඒ හා සමාන මූල්‍ය දිරිදීමනා ජාතික පරිමානව ක්‍රියාත්මක වනු ඇත. නව නීතිය යටතේ දැනට රක්ෂනය වී නැති අය සමගින් හාම්පුතුන් විසින් වියදම් දරන ප්‍රතිලාභ අහිමි වන කම්කරුවන්ට ප්‍රාන්තයන් මගින් පවත්වාගෙන යන ඊනියා රක්ෂන හුවමාරු මත ආවරනය මිලදී ගැනීමට බලකෙරෙනු ඇත. එය කිරීමට අසමත් වුවහොත් ඔවුන් දඩ ගෙවිය යුතුය.

ආසන්න වසයෙන් මිලියන 24ක් වන නව පාරිභෝගියන්ගේ ආගමනයෙන් හදිසි ලාභ ඉපැයීමේ අපේක්ෂාවෙන් පසුවන රක්ෂන දැවැන්තයෝ වියදම් කපන ලද තම සැලසුම් ගුනාත්මක ආවරනයක මිල දරාගත නො හැකි කම්කරුවන් අතර ජනප්‍රිය වනු ඇතැයි ඔට්ටු අල්ලමින් සිටිති යි *ටයිම්ස්* වාර්තා කලේ ය. "එලඹෙන වසර කිහිපයේ සාර්ථකත්වයක් වර්ධනය වේ යයි අප හිතනවා" යයි රටෙහි විශාලතම පුද්ගලික සෞඛ්‍ය රක්ෂන සමාගමක් වන වෙල්පොයින්ට්හි විධායක උපසභාපතිවරයෙක් වන කෙන් ගවුලට් පුවත්පතට කීවේ ය.

ඔබාමාගේ සෞඛ්‍ය සැලසුම සම්මත කරගැනීමේ උද්ඝෝෂනයට නායකත්වය දුන්නේ *නිව් යෝක් ටයිම්ස්* ය. "නව සෞඛ්‍ය නීතිය, දශක තුනකටත් වැඩිකලකට පෙර අසමානතාව වර්ධනය වීම වූ තැන් පටන් මධ්‍යම ආන්ඩුවෙන් අසමානතාව මත එල්ල කල විශාලතම ප්‍රහාරය යි,"යයි මාර්තු 24 දා *ටයිම්ස්හි* පල වූ "සෞඛ්‍ය බිල හරහා ඔබාමා සෞඛ්‍ය අසමානතාවට පහර දෙයි" යන හිසින් යුතු ලිපියක ඩේවිඩ් ලියොන්හාඩ්ට ලිවී ය. එය වනාහි " ඉතිහාසඥයින් රීගන් යුගය යනුවෙන් හඳුන්වා ඇති දෙය අවසන් කිරීම සඳහා ගත් දැනුවත් උත්සාහයකි," යයි ඔහු දිගට ලිවී ය.

මෙය ඉතා පැහැදිලි මුසාවක් වන අතර *ටයිම්ස්හි* හොඳින් වැටුප් ලබන රචකයෝ සහ කතුවරු එය දනිති. ඇත්ත වසයෙන් ම සෞඛ්‍යාරක්ෂනය කැපීමේ ඔබාමාගේ සැලැස්ම 1980 ගනන්වල ආරම්භ කරන ලද සංගත සහ ආන්ඩු විසින් කම්කරු පන්තිය මත එල්ල කරනු ලබන අවසන් නො වූ ප්‍රහාරයක කොටසකි. පසුගිය වසරේ ජෙනරල් මෝටර්ස් සහ ක්‍රයිස්ලර් යන සමාගම්වල බලහත්කාරී බංකොලොත් භාවය ප්‍රකාශ කිරීමේ දී මෝටර් රථ කම්කරුවන්ගේ සෞඛ්‍ය ප්‍රතිලාභ මත ඩිමොක්‍රටික් ජනාධිපතිවරයා එල්ල කල ප්‍රහාරය මගින් ද මෙය සංඥා කරනු ලැබිනි.

ඔබාමාගේ සෞඛ්‍යාරක්ෂන "ප්‍රතිසංස්කරනය" පිලිබඳ *ලෝසවෙඅ* වාර්තාව කම්කරු පන්ති විරෝධී නීතියට උඩගෙඩිදුන් සියලු ව්‍යාජ-වාම සංවිධාන සහ *නේෂන්* මධ්‍යම-පන්තික ප්‍රකාශකයන්ගෙන් අපව වෙන් කර තබයි.

ජෙරී වයිට්

© www.wsws.org